මගේ අංකය :- JSC/SPO/EB/2019(2024)

සියලුම,
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්/ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019**

අංක 2088/26 හා 2018 සැප්තැම්බර් මස 11 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධාරීන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 10.10 වගන්තිය සහ "ඒ" පරිශිෂ්ඨයෙහි 01.3 හි දැක්වෙන කොන්දේසි හා විෂය නිර්දේශය අනුව අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොළඹ දී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ සේවාවේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක I වන ශ්‍රේණියට 2019.12.31 දිනට පෙර උසස්වීම් ලද නිලධාරීන් පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

- අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක I වන ශ්‍රේණියේ නිලධාරීන් එම ශ්‍රේණියට උසස්වීම් ලබා වසර 05 ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

02. විභාගය පිළිබඳ විස්තරය

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කළමනාකරණය | පැය 02 | 100 | 40 |
| 02 | ලසු ලේඛනය හා යතුරු ලියනය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | විනාඩි 50 | 100 | 40 |
| 03 | ලිපි කෙටුම්පත් කිරීම (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | විනාඩි 45 | 100 | 40 |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | කාර්යාල කළමනාකරණය | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි, කාර්යාල ක්‍රම හා කාර්යාල සංවිධානය පිළිබඳ අවබෝධය මැනීම |
| 02 | ලසු ලේඛනය හා යතුරු ලියනය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | (1) ලසු ලේඛනය හා යතුරු ලියනය (සිංහල) - විනාඩියකට වචන 90 ක අවම වේගයෙන් විනාඩි 05ක් තුළ කියවනු ලබන පාඨයක් ලසු ලේඛනය කර එය විනාඩියකට වචන 09 ක වේගයෙන් යතුරු ලියනය කිරීම. |
| | | (2) ලසු ලේඛනය හා යතුරු ලියනය (දෙමළ) - විනාඩියකට වචන 90 ක අවම වේගයෙන් විනාඩි 05ක් තුළ කියවනු ලබන පාඨයක් ලසු ලේඛනය කර එය විනාඩියකට වචන 09 ක වේගයෙන් යතුරු ලියනය කිරීම. |
| | | (3) ලසු ලේඛනය හා යතුරු ලියනය (ඉංග්‍රීසි) - විනාඩියකට වචන 110 ක අවම වේගයෙන් විනාඩි 05ක් තුළ කියවනු ලබන පාඨයක් ලසු ලේඛනය කර එය විනාඩියකට වචන 11 ක වේගයෙන් යතුරු ලියනය කිරීම. |
| 03 | ලිපි කෙටුම්පත් කිරීම (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | දෙනු ලබන මාතෘකා යටතේ ලිපි කෙටුම්පත් කර ඒවා නිවැරදිව තම අත් අකුරින් ලියා ඉදිරිපත් කිරීම |

(අයදුම්කරුගේ පත්වීම අනුව ඉහත 02 හි (1), (2), (3) හා 03 හි ප්‍රශ්න පත්‍ර අතරින් අදාළ ප්‍රශ්න පත්‍රය තෝරා ගත යුතුය.)

04. මෙම ප්‍රශ්න පත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා/ හෝ ප්‍රායෝගික ප්‍රශ්න වලින් සමන්විත වනු ඇත.

